© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## අන්තර්මධ්‍ය අදියර

## 2009 මාර්තු විභාගය

විභාග දිනය : 2009 අප්‍රේල් 04 — පිටු ගණන : 04

විභාග වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30 — ප්‍රශ්න ගණන : 05

<u>අයදුම්කරුවන්ට උපදෙස්:</u>

1. නියමිත කාලය <u>පැය 3</u> කි.
2. ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ <u>සිංහල</u> භාෂාවෙන් පමණි.

| <u>විෂය</u> | <u>විෂය සංකේතය</u> |
|---|---|
| **බදුකරණය** | **(TAX / 605)** |

---

**<u>ප්‍රශ්න අංක 01</u>** <u>*(ලකුණු 35)*</u>

සබන් කුඩු නිෂ්පාදනය කරන සීමාසහිත වයිකින්ස් සමාගම තක්සේරු වර්ෂ 2007/08 වෙනුවෙන් පහත සඳහන් විස්තර ඉදිරිපත් කරයි. එම තොරතුරු අනුව එම සමාගමේ ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු කළ හැකි ආදායම, බදු අයකළ හැකි ආදායම හා තක්සේරු වර්ෂ 2007/08 වෙනුවෙන් ගෙවිය යුතු ඉතිරි බද්ද ගණනය කරන්න.

වෙනස් දිනයන්හි ගත් ලෙස සටහන් කර ඇති වත්කම් හැර සියලුම වත්කම් 2005 අප්‍රේල් මස අත්පත් කර ඇත. ගොඩනැගිල්ල ද එම වර්ෂයේම ඉදිකර ඇත.

<u>විස්තර:</u>

(i) බද්දට යටත් කිරීමට පෙර ශුද්ධ ලාභය රු. 30,000,000 කි.

(ii) ශුද්ධ ලාභයට ඇතුළත් කර ඇති වෙනත් ආදායම් පහත සඳහන් වේ.

| | | රු. |
|---|---|---|
| ගොඩනැගිල්ලේ කොටසක් කුලියට දීමෙන් ලැබුණු දළ කුලිය | | 500,000 |
| අඩුකළා: එම කොටසට අදාළ වරිපනම් | | <u>30,000</u> |
| | | 470,000 |
| අඩුකළා: එම කොටසට අදාළ අලුත්වැඩියා වියදම් | | <u>280,000</u> |
| ශුද්ධ කුලිය | | 190,000 |
| ලැබුණු ලාභාංශ (ශුද්ධ) | 63,000 | |
| භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් පොලිය | 360,000 | |
| කාර් රථය විකිණීමෙන් ලාභය රු. 50,000 හා ලොරිය විකිණීමෙන් ලාභය 150,000 | 200,000 | |

(iii) වියදම්වල පහත සඳහන් වියදම් අඩංගු ය.

| | | රු. |
|---|---|---|
| ක්ෂය කිරීම | | 2,572,000 |
| පරිගණකය විකිණීමෙන් අලාභය | | 10,000 |
| ප්‍රචාරක වියදම් | | 400,000 |
| සංග්‍රහ වියදම් | | 300,000 |
| සමාගම පිහිටුවීමේ වියදම් (වර්ෂය තුළ කපාහැරිය ප්‍රමාණය) | | 90,000 |
| පරිත්‍යාග | | 200,000 |
| බොල් ණය | | 60,000 |

(iv) (a)

| වත්කම් | 07.04.01 ශේෂය | එකතුකිරීම් | ඉවත්කිරීම් | 08.03.31 ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 3,000,000 | - | - | 3,000,000 |
| ගොඩනැගිලි | 8,000,000 | - | - | 8,000,000 |
| කාර් රථ | 7,000,000 | 2,000,000 | 1,800,000 | 7,200,000 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 8,000,000 | 750,000 | - | 8,750,000 |
| ලොරි රථ | 6,000,000 | 1,200,000 | 1,100,000 | 6,100,000 |
| පරිගණක | 300,000 | - | 75,000 | 225,000 |
| ලී බඩු | 260,000 | - | - | 260,000 |

(b)

| වත්කම් | 07.04.01 ශේෂය | වර්ෂයට අදාළ ක්ෂයවීම් | ඉවත්කිරීම් | 08.03.31 ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 160,000 | 80,000 | - | 240,000 |
| කාර් රථ | 1,570,000 | 1,000,000 | 700,000 | 1,870,000 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 1,600,000 | 800,000 | - | 2,400,000 |
| ලොරි රථ | 1,200,000 | 610,000 | 250,000 | 1,560,000 |
| පරිගණක | 150,000 | 56,000 | 50,000 | 156,000 |
| ලී බඩු | 52,000 | 26,000 | - | 78,000 |

(v) විධායක නිලධාරීන්ට ඔවුන්ගේ පුද්ගලික හා ව්‍යාපාර ගමන් වෙනුවෙන් කාර් රථ සපයා ඇත. වර්ෂය තුළ එක කාර් රථයක් විකුණූ අතර අතර, ඒ වෙනුවට අලුත් එකක් මිලට ගන්නා ලදී.

(vi) වර්ෂය තුළ දී ලොරියක් විකුණූ අතර, ඒ වෙනුවට පාවිච්චි කළ ලොරියක් මිලට ගන්නා ලදී.

(vii) වර්ෂය තුළ දී විකුණූ පරිගණක යන්ත්‍රය වෙනුවට පරිගණක යන්ත්‍රයක් මිලට ගන්නා ලදී.

(viii) ප්‍රචාරක වියදම්:

| | |
|---|---|
| පාසලේ සඟරාවක භාණ්ඩ ප්‍රචාරය කිරීම | රු. 75,000 |
| වෙළඳ සඟරාවල භාණ්ඩ ප්‍රචාරය කිරීම | රු. 325,000 |

(ix) 2005 හි වැය වූ සමාගම පිහිටුවීමේ වියදම වර්ෂ 5 ක් ඇතුළත කපාහරිනු ලැබේ.

(x) පරිත්‍යාග මුදල්වල අඩංගු දේ:

| | |
|---|---|
| අනුමත පුණ්‍යායතනයක් වන YMBA ආයතනයට මුදල්වලින් පරිත්‍යාගය | රු. 150,000 |
| කොළඹ ජාතික රෝහලට සබන් කැට පරිත්‍යාගය | රු. 50,000 |

(xi) බොල් ණය ලෙස කපාහැරිය රු. 60,000 සේවයෙන් අස්කළ සේවකයෙකුට දුන් ණය මුදලක් සම්බන්ධව ය.

**(මුළු ලකුණු 35)**

**<u>ප්‍රශ්න අංක 02</u>** ***(ලකුණු 30)***

වයස 60 ක් වූ පසු, 2007 සැප්තැම්බර් 30 වන දින රජයේ සේවයෙන් විශ්‍රාම ගිය මිනින්දෝරුවරයෙකු වන රොයිල් මහතා, ඊට පසු පුද්ගලික සමාගමක සේවය අරඹන ලදී. තක්සේරු වර්ෂයට අදාළ ඔහු විසින් සපයා ඇති තොරතුරු අනුව, තක්සේරු වර්ෂ 2007/08 සඳහා ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු කළ හැකි ආදායම, බදු අයකළ හැකි ආදායම, දළ ආදායම් බද්ද හා වර්ෂයට ගෙවිය යුතු ඉතිරි බද්ද ගණනය කරන්න.

ඔබ විසින් යම් ආදායමක් බදු නිදහස් ද හා ඉල්ලා ඇති අඩුකිරීමක් ඉඩදිය නොහැකි බව පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(i) රජයේ සේවයෙන් වැටුප - 2007.04.01 සිට 2007.09.30 ට රු. 270,000

(ii) රජයෙන් ලැබූ විශ්‍රාම මුදල - 2007.10.01 සිට 2008.03.31 ට රු. 200,000

(iii) පුද්ගලික සමාගමෙන් ලැබූ වේතනය - 2007.10.01 සිට 2008.03.31 ට රු. 450,000

(iv) මාතර වාසය කිරීමට මුළු පවුලටම කුලී රහිත නිවසක් සමාගම ඔහුට සපයා ඇත. මාස 6 ට සමාගම ගෙවූ කුලිය රු. 240,000 කි. මෙම නිවසේ වරිපණම් තක්සේරුව රු. 12,000 ක් වූ අතර, කාර්තුවකට ගෙවූ වරිපණම් රු. 1,500 ක් විය.

(v) පෘෘථි සමාගමෙන් ලැබුණු ලාභාංශය පහත සඳහන් පරිදි යඃ
බද්දට යටත් ආදායමෙන් ගෙවූ ලාභාංශ (ශුද්ධ) රු. 36,000
බදු නිදහස් ආදායමෙන් රු. 20,000

(vi) බත්තරමුල්ලේ පිහිටි ඔහුට අයත් නිවසක් විදේශිකයෙකුට කුලියට දී ඇත. දළ මාසික කුලිය රු. 40,000 ක් වූ අතර, කාර්තුවකට අයිතිකරු රු. 3,000 ක් වරිපණම් ලෙස ගෙවන ලදී. රොයිල් මහතා දැරූ අලුත්වැඩියා වියදම් රු. 56,000 කි. 1995 දී මිලට ගත් මෙම නිවසේ වාර්ෂික වටිනාකම රු. 60,000 කි.

(vii) බත්තරමුල්ලේ නිවස මිලට ගැනීමට, ලංකා බැංකුවෙන් ගත් ණය මුදල වෙනුවෙන් ගෙවූ පොලිය රු. 42,000 කි. මේ හැර කාර් රථයක් අත්පත් කර ගැනීමට රොයිල් මහතා විසින් ගත් ණය මුදලකට රු. 11,000 ක් පොලී ලෙස බැංකුවට ගෙවන ලදී.

(viii) වර්ෂය තුළ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු. 150,000 ක දළ පොලියක් ඔහුට ලැබුණි.

(ix) අර්ථසාධක අරමුදලට අඩුකළ දායක මුදල රු. 36,000 කි.

(x) ඔහු වර්ෂය තුළ කළ පරිත්‍යාගඃ
පිළිගත් පුණ්‍යායතනයක් වන පිළිකා සංගමයට පරිත්‍යාගය - මුදලින් රු. 50,000
ජාතික රෝහලේ 47 වන වාට්ටුවේ බිත්තිවල සායම් ගෑමට රු. 110,000

(xi) සේවායෝජකයා අඩුකළ උපයන විට ගෙවීමේ බද්ද රු. 39,000 කි.

**(මුළු ලකුණු 30)**

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 15)</u>*

(a) කම්බි ඇණ නිෂ්පාදනය කරන සීමාසහිත විජය සමාගම විසින් 2008 ජනවාරි මාසයට ඉදිරිපත් කර ඇති විස්තර අනුව, එම මාසයට සමාගම විසින් ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද (වැට් බද්ද) ගණනය කරන්න.

(පහත සඳහන් සෑම ගනුදෙනුවක්ම එකතු කළ අගය එකතුකිරීමට පෙර ප්‍රමාණයන් වේ)

| | රු. |
|---|---|
| විකුණුම් | 4,000,000 |
| ආනයනය කළ අමුද්‍රව්‍ය | 2,800,000 |
| කාර්යාලයට ආනයනය කළ වායුසමීකරණය (සුබෝපභෝගී අනුප්‍රමාණයට යටත්ය) | 300,000 |
| එකතුකළ අගය මත බද්දට ලියාපදිංචි නොවූ අයගෙන් ගැනුම් | 200,000 |
| විදුලිය (බද්දෙන් නිදහස්ය) | 96,000 |
| දුරකථන වියදම් | 80,000 |

**(ලකුණු 13)**

(b) අපනයනය කරන භාණ්ඩ ශුන්‍ය අනුප්‍රමාණයට යටත් ය. එකතුකළ අගය මත බද්ද සම්බන්ධව මෙම වගන්තියේ වැදගත්කම පැහැදිලි කරන්න. **(ලකුණු 02)**

**(මුළු ලකුණු 15)**

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 10)</u>*

(a) ආර්ථික සේවා ගාස්තු කාර්ය සඳහා පිරිවැටුම යන වචනය අර්ථ නිරූපණය කළ හැක්කේ කෙසේ ද? **(ලකුණු 04)**

(b) තක්සේරු වර්ෂ 2007/08 හි ආර්ථික සේවා ගාස්තුව වාර්ෂික අයකිරීමක් ද? නැතහොත් කාර්තු මත අයකිරීමක් ද? **(ලකුණු 02)**

(c) 2007.04.01 දින සිට ආර්ථික සේවා ගාස්තුවට යටත් වන පිරිවැටුම් සීමාව කොපමණ ද? **(ලකුණු 02)**

(d) 2007.04.01 දින සිට එළඹෙන කාර්තු වෙනුවෙන් ආර්ථික සේවා ගාස්තු ලෙස අය කළ හැකි උපරිම ප්‍රමාණය කොපමණ ද? **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 10)</u>*

මූල්‍ය ආයතනවල තැන්පත් කළ මුදල් වෙනුවෙන් පොලී ආදායම ලබන පුද්ගලයින් (Individuals) පොලී මත රඳවාගැනීමේ බද්දට යටත් ය. මූල්‍ය ආයතන විසින් පුද්ගලයින් සම්බන්ධව මෙම බද්ද අයකරන පදනම පැහැදිලි කරන්න.

**(මුළු ලකුණු 10)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***